7th International Conference of Multidisciplinary Approaches (iCMA), 2020
Faculty of Graduate Studies,
University of Sri Jayewardenepura,
Sri Lanka.
ISSN: 2386 – 1509
Copyright © iCMA


# කෝවිඩ්-19 වසංගත තත්ත්වය හමුවේ ඩිජිටල්කරණය ශ්‍රී ලංකාවේ සමාජ මානයන් කෙරෙහි ඇති කළ බලපෑම පිළිබඳ ඩිජිටල් මානව විද්‍යාත්මක විශ්ලේෂණයක්

අභයසුන්දර පී.එන්.[1], විතානගේ ඩබ්ලිව්.කේ.එම්.[1,3]*, දිසානායක ඩී.එම්.කේ.ජී.කේ.[2], සහ ගනේආරච්චිගේ ඒ.එන්.එස්.[1]

[1]මානව විද්‍යා අධ්‍යයනාංශය, මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
[2]ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
[3]පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
wkanishka27@gmail.com

**සාරසංක්ෂේපය**
මානව සංහතියේ අනේකවිධ අංශ පිළිබඳ පෘථුල විද්‍යාත්මක පදනමකින් විපරම් කරන්නා වූ මානව විද්‍යා විෂය ක්ෂේත්‍රයේ, සාකල්‍යවාදී බව මනා ව පසක් කරන උපවිෂය පථයක් වන්නේ ඩිජිටල් මානව විද්‍යාව යි. සෛද්ධාන්තික දෘෂ්ටිපථයක් ඔස්සේ සිදු කරනු ලැබූ මෙම අධ්‍යයනය හරහා කෝවිඩ් සමයේ ලාංකේය සමාජ මානයන් ත්‍රිත්වයක් කෙරෙහි ඩිජිටල්කරණය නමැති සාධකය බලපෑ අන්දම පිළිබඳ විමසනු ලැබේ. එහි ලා සෞඛ්‍ය අංශය, අධ්‍යාපනය සහ සමාජ සම්බන්ධතා ආදිය කෙරෙහි ඩිජිටල් නමැති ප්‍රස්තුතය හේතුපාදක වෙමින් සිදු වූ සමාජ වෙනස් වීම පිළිබඳ අන්තර් සහ බහීර් ප්‍රවේශ (etic and emic approaches) ඔස්සේ හඳුනාගෙන තිබේ. ඩැනියෙල් මිලර් සහ හේදර් හෝර්ස්ට්ගේ ඩිජිටල් මානව විද්‍යා මූලධර්ම සය (ඩිජිටල් නිසා තීව්‍ර වන සංස්කෘතියේ තාර්කික (අපෝහක) ස්වාභාවය, මනුෂ්‍යත්වය යනු වර්ධනය වන ඩිජිටල් මැදිහත් වන අංශුමාත්‍රික දෙයක් පමණක් ම නො වන බව, සාකල්‍යතාවාදයට වන කැපවීම, සංස්කෘතික සාපේක්ෂතාව සහ ගෝලීය ස්වාභාවය, අවිනිශ්චිතතාවයේ සත්‍යතාවය, ඩිජිටල් ලෝකවල ද්‍රව්‍යමයභාවය) හරහා මානව හැසිරීමෙහි වෙනස්වීම් විමර්ශනයට ලක් කර ඇත. කොරෝනා වෛරසයේ ව්‍යාප්තියත් සමඟ ලාංකේය සමාජ-සංස්කෘතික වෙනස් වීම කෙරෙහි ලාංකේය පුරවැසියා හට අනුවර්තනය වීමට සිදු විය. එවැනි වෙනසක් සඳහා මග සකස් කළ ප්‍රධානතම අංශයක් වූයේ ඩිජිටල්කරණය යි. ඩිජිටල් මානව විද්‍යාව තුළ පවත්නා වූ පොදු සාධකයක් වන සාකල්‍යවාදී ගුණය තවදුරටත් ඔප්පු කිරීම සඳහා මෙම පර්යේෂණයේ ප්‍රතිඵල හේතු වෙයි. කෝවිඩ් සමය තුළ තථ්‍ය ලෝකයේ සිට අතථ්‍ය ලෝකය දක්වා ලාංකේය සමාජ යාන්ත්‍රණය යොමු වීමේ වර්ධනය අන්තර් හා බහීර් දෘෂ්ටිකෝණයන් ඔස්සේ නිගමනය කිරීමට හැකියාව ලැබුණි.

***ප්‍රමුඛ පදඃ*** සාකල්‍යවාදී, ඩිජිටල්, කෝවිඩ්-19, සංස්කෘතිය, අන්තර් ප්‍රවේශය, බහීර් ප්‍රවේශය